සැ. යු. : (i) 2025.10.10 දින පළ කරන ලද අංක 2458 ගැසට් පත්‍රයේ IV අ කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,459 - 2025 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2025.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු අ◌ැබෑර්තු ... ... | 2422 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 2451 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 නොවැම්බර් මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2419- B 82729 — (2025/10)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සැම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සැම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සැම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සැම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සැම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සැම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සැම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම- 2024

අංක 1887/17 සහ 2014.10.11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුව දන්ත වෛද්‍ය නිලධාරී (11 ශ්‍රේණියේ ) තනතුරේ පවත්නා පුරප්පාඩු 158ක් සේවා ප්‍රමුඛතාවය මත හඳුනාගත් තනතුරු 64 ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහි 04 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන දන්ත ශල්‍ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇති අනුයුක්ත කිරීම සඳහා පුරප්පාඩු ලේඛනය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් භාරගැනීම **2025 ඔක්තෝබර් මස 23 දින** පවුල් සෞඛ්‍ය කාර්යංශයේ දී සිදු කෙරේ. එදින **පෙ.ව 9.00 සිට ප.ව 1.00** දක්වා අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයේ සාමාජිකයන්, එම ස්ථානයේ දී ඔබගේ සහතික පත්‍ර පරීක්ෂා කිරීම සහ සේවා ස්ථාන සඳහා මනාප ලකුණු කිරීම සඳහා ඔබට සහය වනු ඇත. වැඩිදුර විස්තර සඳහා දුරකතන අංක 0112692846 මඟින් අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයෙන් විමසීම් කළ හැක.

02. මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසිකව

රු.91,750-3×2,400 - 7×2,420- 2×2,940- 16×3,900- රු. 184,170(SL 2-2025).

මෙයට අමතරව රාජ්‍ය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛවලින් සපයා ඇති ප්‍රතිපාදන අනුව ගෙවන දීමනාව ද ඇතුළත් වේ. කෙසේ වුවද , ඔබ විසින් මෙම වැටුප් පරිමාණයේ 04 වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබගේ පත්වීම, පත්වීම් ලද දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට සහ නියෝගවලට ද ඔබගේ පත්වීම යටත්ය. තවද පත්වීම ලද දිනයේ සිට වසර 5ක් ඉකුත් වීමට පෙර 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඔබ විසින් ලබාගත යුතු අතර එසේ නැතහොත් වැටුප් වර්ධක අත්හිටවනු ඇත.

04. මෙම පත්වීම සඳහා බඳවා ගැනීමට කුසලතා ලේඛනය සකස් කිරීමේ දී ප්‍රමුඛතාවය පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයේ දන්ත වෛද්‍යවේ දී උපාධිය ලත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් එම පීඨයෙන් නිකුත් කළ කුසලතා ලේඛනයට අනුකූලව සහ විදේශ දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබාගත් අයවලුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලබාදෙන කුසලතා අනුපිළිවෙල අනුවය.

05. උපාධිධාරීන්ගේ අයදුම්පත් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ බඳවා ගැනීමේ ක්‍රමය අනුව සලකා බලනු ලැබේ.

06. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුණා ඉදිරිපත් කළයුතු අතර **2025 ඔක්තෝබර් මස 23** වැනි දින පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) නිසි පරිදි පුරවා අත්සන් කොට සහතික කරන ලද අයදුම්පත හා අභිමතය පළ කිරීමේ ආකෘති පත්‍රය.
(ආ) උප්පැන්න සහතිකයේ පිටපත් 03 ක්.
(ඇ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ පිටපත් 03ක්.
(ඈ) ජාතික හැඳුනුම්පතේ දෙපසම දැක්වෙන පරිදි ලබාගත් ඡායා පිටපත් 03ක්

07. කුසලතා ලේඛනය , පුරප්පාඩු ලේඛනය, දෙවැනි ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීමේ නිවේදනය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘතියට සකසන ලද අයදුම්පත හා ප්‍රකාශන පත්‍රය අයදුම්කරුවන් හට www.health.gov.lk වෙබ් අඩවියට පිවිස හෝ අධ්‍යක්ෂ ( දන්ත සේවා ) කාර්යාලයෙන් ලබාගත හැක.

08. අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය තමා කැමති සේවා ස්ථානය ලකුණු කිරීමේ දී තම කුසලතා අංකයට සමාන හෝ වැඩිපුර සේවා ස්ථානයක් දක්වා එවන ලෙසට සියලුම අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවෙහි අනුමැතිය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

VACANCY LIST FOR POST INTENRN APPOINTMENTS - 2024

| *No.* | *NAME OF THE INSTITUTION* |
|---|---|
| 1 | DGH BADULLA HO Resto |
| 2 | DGH BADULLA HO Resto |
| 3 | DGH HAMBANTHOTA HO OMF |
| 4 | DGH NUWARAELIYA DS |
| 5 | DGH NUWARAELIYA HO OMF |
| 6 | DGH POLONNARUWA HO Resto |

| No. | NAME OF THE INSTITUTION |
|---|---|
| 7 | DGH TRINCOMALEE HO OMF |
| 8 | DH HIGHFOREST PLACED AT BH RIKILLAGASKADA HO ORHTO |
| 9 | TH ANURADHAPURA HO Resto |
| 10 | TH ANURADHAPURA SHO OMF |
| 11 | TH BATTICALOA HO OMF |
| 12 | TH BATTICALOA HO OMF |
| 13 | TH BATTICALOA HO Ortho |
| 14 | TH BATTICALOA SHO Resto |
| 15 | ADC POTHUVIL CENTRAL COLLEGE DS |
| 16 | BH DEHIATHTHAKANDIYA DS |
| 17 | BH DEHIATHTHAKANDIYA DS |
| 18 | DGH AMPARA DS |
| 19 | DGH AMPARA Relief DS |
| 20 | DGH AMPARA Relief DS |
| 21 | DH SENARATHPURA DS |
| 22 | RDHS OFFICE AMPARA Mobile / Relief DS |
| 23 | BH KABITHIGOLLEWA DS |
| 24 | BH MEDAWACHCHIYA DS |
| 25 | DH HURULUWEWA DS |
| 26 | BH MAHIYANGANA DS |
| 27 | BH MAHIYANGANA DS |
| 28 | BH MAHIYANGANA DS |
| 29 | DH ATTAMPITIYA DS |
| 30 | DH BOGAHAKUMBURA DS |
| 31 | DH GIRANDURUKOTTE DS |
| 32 | DH METIGAHATHENNA DS |
| 33 | DH PASSARA DS |
| 34 | MOH PASSARA DS |
| 35 | MOH UVAPARANAGAMA DS |
| 36 | RDHS OFFICE BADULLA Mobile / Relief DS |

| No. | NAME OF THE INSTITUTION |
|---|---|
| 37 | DH KATARAGAMA DS |
| 38 | BH MALLAVI DS |
| 39 | DH ADDALAICHENAI DS |
| 40 | DH IRAKKAMAM DS |
| 41 | DH VERAVIL DS |
| 42 | DH MAHO DS |
| 43 | RELIEF GALGAMUWA ZONE PLACED AT BH GALGAMUWA Relief DS |
| 44 | BH MURUNKAN DS |
| 45 | DGH MANNAR DS |
| 46 | DGH MANNAR DS |
| 47 | DH THALAIMANNAR DS |
| 48 | RDHS OFFICE MANNAR A RDS |
| 49 | RDHS OFFICE MANNAR Relief DS |
| 50 | DH HANDUNGAMUWA DS |
| 51 | DH LAGGALA PALLEGAMA DS |
| 52 | BH DENIYAYA DS |
| 53 | RDHS OFFICE MONARAGALA Mobile / Relief DS |
| 54 | RDHS OFFICE MONARAGALA RDS |
| 55 | RDHS OFFICE MONARAGALA Relief DS |
| 56 | DH LAXAPANA DS |
| 57 | DH LINDULA DS |
| 58 | RDHS OFFICE NUWARAELIYA Mobile / Relief DS |
| 59 | BH MEDIRIGIRIYA DS |
| 60 | MOH HINGURAKGODA DS |
| 61 | DH NAWAGATHTHEGAMA DS |
| 62 | DH KIRIPORUWA (EHELIYAGODA) RELIEF AT PMCU ELLAWALA DS |
| 63 | DH PADAVI SRIPURA DS |
| 64 | DGH BADULLA |

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

### අංක 1877/27 දරන 2014.08.28 දිනැති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු පවතින පරිසර අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද, 1996/25 හා 2016 දෙසැම්බර් මස 06 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද, 2006.01.01 දින සිට බල පැවැත්වෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තිය ප්‍රකාරව, 2025.11.14 දිනට 02 ඡේදය යටතේ දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ දැනට සක්‍රීය සේවයේ නියුතු I ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *අමාත්‍යාංශය* | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|
| 01 | පරිසර අමාත්‍යාංශය (පරිසර අංශය) | අධ්‍යක්ෂ | 01 |

02. **උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :**

| *අනු අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සුදුසුකම* |
|---|---|---|---|
| 01 | පරිසර අමාත්‍යාංශය (පරිසර අංශය) | අධ්‍යක්ෂ | උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, පරිසර කළමනාකරණය, පරිසර ඉංජිනේරු විද්‍යාව, වන විද්‍යාව, කෘෂිකර්මය, පාරිසරික කෘෂිකර්මය, පාරිසරික ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සම්බන්ධයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත්වීම් නොලද විශේෂ ශ්‍රේණියේ හෝ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම |

03. **තනතුරු සඳහා තෝරා ගනු ලබන ක්‍රමය :**

(i) යොෂ්‍යතාව සහ කුසලතාව පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත පහත දැක්වෙන ලකුණු පරිපාටියට අනුකූලව ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(ii) මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් කිහිපදෙනෙකු සම ලකුණු ලබාගතහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) ප්‍රකාරව එකී සම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් සීමා වූ අමතර කුසලතා - පාදක සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණයක් උපයෝගී කරනු ගනු ලැබේ. අදාළ අයදුම්කරුවන්ට මෙම ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණය පිළිබඳව එම අවස්ථාවේ දී පූර්ව දැනුවත් කිරීමක් සිදු කරනු ලැබේ.

04. ලකුණු පරිපාටිය :

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *මුළු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **1. ජ්‍යෙෂ්ඨතාව :** | | **50** |
| I.1. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br>➢ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br>➢ අනෙකුත් නිලධරයන් සඳහා ජ්‍යෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)) x අදාළ නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 | |
| **2. කුසලතාව :** | | **50** |
| I. පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publications) – (ක්ෂේත්‍රයට අදාළව කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කරන ලද; ) | | |
| ➢ දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන(Local Research Publications) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 04 | |
| ➢ ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන (International Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 03 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 06 | |
| II. සාරාංශ (Abstracts) – ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ ශ්‍රී ලංකාව තුළ (Local ) – එක් සාරාංශයක් සඳහා ලකුණු 02බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා) | 04 | |
| ➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා | 05 | |
| III. නිබන්ධන - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ එක් නිබන්ධනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නිබන්ධන 1ක් සඳහා (සැ.යු : දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස් වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දේ) | 04 | |
| IV. නව්‍යතා / නවෝත්පාදනයන් - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ එක් නව්‍යතා / නවෝත්පාදනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නව්‍යතා / නවෝත්පාදනයන් 2ක් සඳහා (අදාළ නිලධරයන්ගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු වේ)<br>**සටහන** - අදාළ නිලධරයන්ගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු අතර එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇගයීමට ලක්කර නව්‍යතාවක් හෝ නවෝත්පාදනයක් යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලකුණු ලබා දෙනු ලැබේ. | 08 | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| V. පුවත්පත් / සඟරා ලිපි - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද )<br>➢ එක් පුවත්පතක් / සඟරා ලිපියක් සඳහා ලකුණු 02 බැගින් උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා | 04 | |
| VI. තෝරාපත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br>I. අදාළත්වය (Relevancy) - ලකුණු 03<br>II. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 03<br>III. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා - ලකුණු 03<br>(Innovations & Suggestions)<br>IV. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 03<br>V. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 03<br>**සටහන -**<br>අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | 15 | |
| **මුළු ලකුණු** | | **100** |

05. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට සිදු කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධන වලට ද යටත්ව, තෝරා ගනු ලබන නිලධරයින් අදාළ තනතුරුවල රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

06. මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රීය සේවයේ නිරත නිලධාරින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් **2025.11.14** දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන්වන පැමිණිලි භාර ගනු නොලැබේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

09. අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර**
ලේකම්.
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

2025 ඔක්තෝබර් මස 13 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

.......................................................... අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ
..................... තනතුර සඳහා ඉල්ලුම් කිරීම

1. නිලධරයා සම්බන්ධ තොරතුරු :
   i. සම්පූර්ණ නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):..........................................................................
   ..........................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
   ii. මුලකුරු සමඟ නම: ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)Mr./Mrs./Miss:................................................
   ..........................................................................................................................
   (උදා: GUNAWARDHANA, H. M. S. K.)
   iii. සම්පූර්ණ නම (සිංහලෙන්) :.........................................................................................
   iv. මුලකුරු සමඟ නම (සිංහලෙන්) ............................................................................
   v. උපන් දිනය:................................................................
   vi. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස: අවු ............. මාස .............. දින .................
   vii. ජාතික හැඳුනුම්පත් අංකය : .............................
   viii. ස්ථිර ලිපිනය :..........................................................................................................
   ..........................................................................................................................
   ix. දුරකථනය අංක : කාර්යාලය : .......................... ජංගම :.......................................
   x. විද්‍යුත් ලිපිනය :..........................................................................................................

2. තනතුර පිළිබඳ තොරතුරු :
   i. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය : .....................................................
   ii. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය : .....................................................
   iii. II ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය : .....................................................
   iv. I ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය: .....................................................
   v. දැනට දරන තනතුර: .....................................................
   vi. එම තනතුරට පත් වූ දිනය: .....................................................

3. ජ්‍යෙෂ්ඨතාව :

| | | |
|---|---|---|
| 01 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 02 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 03 | වැටුප් රහිත නිවාඩු ලබා ඇති / නැති බව (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ලබා ඇති දින සඳහන් කරන්න) | |

4. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම් :

4.1 අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| *ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම්* | *විස්තර* | *අදාළ වර්ෂය* |
|---|---|---|
| පර්යේෂණාත්මක ප්‍රකාශන<br>I. දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන<br>II. ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන | | |
| සාරාංශ :<br>I. ශ්‍රී ලංකාව තුළ<br>II. ජාත්‍යන්තර | | |
| නිබන්ධන | | |
| නව්‍යතා / නවෝත්පාදනයන් | | |
| පුවත්පත් / සඟරා ලිපි | | |

5. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ............................... .........................................,
අයදුම්කරුගේ අත්සන.

II කොටස
(අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් සම්පූර්ණ කළයුතු වේ)

..................................................................................... අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ ........................................................................................................... මයා / මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය / වැරදිය. ඔහුට / ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගැනීමට අදහස් කර නොමැති / ඇති බවත්, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

........................................................
අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නිල මුද්‍රාව

දිනය : ...............................

10-244

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉදුරාම නාවිකයින් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉදුරාම නාවික ශිල්පීන් හා ශිල්පිනියන් සඳහා පුරප්පාඩු පවතින අතර, පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි හා කාන්තා අයදුම්කරුවන්ගෙන්/ අයදුම්කාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු ය :-

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය. |
| ආ. | වයස | - 2025 නොවැම්බර් මස 06 දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 33 ට නොවැඩි විය යුතු ය. |
| ඇ. | උස | - පිරිමි 5' 5" (සෙ.මී 165.10) කාන්තා 5' 2" (සෙ.මී 157.48). |
| ඈ. | ශරීර ස්කන්ධ දර්ශකය | - 17-27 |
| ඉ. | පපුව | - පිරිමි 32'' (සෙ.මී 81.28). |
| ඊ. | වර්ණ දෘෂ්ඨිය | - එස්ටීඩී II |
| උ. | දුර දර්ශනය | - 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (6/12 දෘෂ්ඨි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන් / අයදුම්කාරිනියන් සලකා බැලිය හැක). |
| ඌ. | සිවිල් තත්වය | - අයදුම්කරුවන්ට විවාහක/ අවිවාහක දෙපාර්ශවයෙන්ම අයදුම් කළ හැක. කිසිම ආධුනිකයකු හට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

3. බඳවාගනු ලබන අංශය: සිවිල් ඉංජිනේරු ශිල්පී

4. **අධ්‍යාපන සුදුසුකම්**

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ මව්බස ඇතුළු විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම සහ පහත සඳහන් ඒ ඒ තරාතිරම් සඳහා වෘත්තීය සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද තිබිය යුතු ය.

ආ. අ.පො.ස. (උ/පෙළ) භෞතිය විෂය ධාරාව/ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

5. වෘත්තීය සුදුසුකම්

අ. **සිවිල් ඉංජිනේරු ශිල්පී (III පන්තිය) තරාතිරම සඳහා වෘත්තීය සුදුසුකම් (අවු 18-33)**

(1) ජාතික තාක්‍ෂණික සහතිකය (NCT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(2) ජාතික තාක්‍ෂණික සහතිකය (NCT) ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව සාර්ථකව නිම කිරීම;

හෝ

(3) කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ ජාතික සහතිකය (NCIT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(4) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා සමාන NVQ V මට්ටමේ තාක්‍ෂණික සහතික පත්‍ර / ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම ;

සහ

(5) රජයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම.

ආ. **සිවිල් ඉංජිනේරු ශිල්පී (IV පන්තිය) තරාතිරම සඳහා වෘත්තීය සුදුසුකම් (අවු 18-30)**

(1) ජාතික තාක්‍ෂණික සහතිකය (NCT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම;

හෝ

(2) ජාතික තාක්‍ෂණික සහතිකය (NCT) ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(3) කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ ජාතික සහතිකය (NCIT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම;

හෝ

(4) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා

සමාන NVQ V මට්ටමේ තාක්ෂණික සහතික පත්‍ර / ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම ;

සහ

(5) රජයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම.

ඇ. **සිවිල් ඉංජිනේරු ශිල්පී (I ශ්‍රේණිය) තරාතිරම සඳහා වෘත්තීය සුදුසුකම් (අවු 18-28)**

(1) ජාතික තාක්ෂණික සහතිකය (NCT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(2) ජාතික තාක්ෂණික සහතිකය (NCT) ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව සාර්ථකව නිම කිරීම;

හෝ

(3) කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතිකය (NCIT) සිවිල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(4) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා සමාන NVQ V මට්ටමේ තාක්ෂණික සහතික පත්‍ර / ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම ;

හෝ

(5) රජයේ කාර්මික විද්‍යාලයක වසරක පූර්ණකාලීන සැලසුම් ශිල්පය පිළිබඳව ජාතික සහතිකය (NCED) පාඨමාලාව සාර්ථකව නිම කිරීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා සමාන NVQ IV මට්ටමේ තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම ;

සහ

(6) රජයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් තිබීම.

ඈ. **සිවිල් ඉංජිනේරු ශිල්පී (II ශ්‍රේණිය) තරාතිරම සඳහා වෘත්තීය සුදුසුකම් (අවු 18-26)**

(1) රජයේ කාර්මික විද්‍යාලයක වසරක පූර්ණකාලීන සැලසුම් ශිල්පය පිළිබඳව ජාතික සහතිකය (NCED) පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා සමාන NVQ IV මට්ටමේ තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම ;

සහ

(3) රජයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම.

ඉ. **සිවිල් ඉංජිනේරු ශිල්පී (III ශ්‍රේණිය) තරාතිරම සඳහා වෘත්තීය සුදුසුකම් (අවු 18-24)**

(1) රජයේ කාර්මික විද්‍යාලයක වසරක පූර්ණකාලීන සැලසුම් ශිල්පය පිළිබඳව ජාතික සහතිකය (NCED) පාඨමාලාව සාර්ථකව නිම කිරීම ;

හෝ

(2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත ආයතනයකින් ඒ හා සමාන NVQ IV මට්ටමේ තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.

6. ඉහත 1, 2, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමි වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවකුගේ/අයදුම්කාරිනියකගේ උස නියමිත පරිදි නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු හෝ ඇය ගැන සලකා බලනු ලැබේ.

7. සේවා කොන්දේසි:

අ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ශිල්පීය අංශයේ III, IV පන්තියේ සහ I, II, III ශ්‍රේණියේ නාවිකයින්/ කාන්තා නාවිකයින් වශයෙන් නිත්‍ය නාවික හමුදාව වෙත මූලික සේවා කාලය වසර 15ක් සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් නාවික හමුදාවේ මූලික පුහුණුවීමේ පාඨමාලාව හැදෑරිය යුතු වේ.

ආ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව, බඳවාගත් නාවිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඇ. සෑම බඳවාගත් නාවිකයකු/කාන්තා නාවිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් සපයනු ලැබේ.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ, බඳවාගත් නාවිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මගින් සපයනු ලැබේ.

ඉ. පුහුණුවන කාලසීමාව තුළ දී, යම් නාවිකයකු හට සිය කැමැත්තෙන් නාවික හමුදාවෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නාවිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නාවිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. සියලුම නාවිකයින් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

8. **රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:** තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

9. වැටුප් හා දීමනා :

2025.04.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 අනුව වේ. ඒ අනුව -

| | | |
|---|---|---|
| අ. | මූලික වැටුප | - රු. 49,197.00 |
| ආ. | ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| ඇ. | නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| ඈ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඉ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඊ. | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00<br>- විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| උ. | දළ වැටුප | **- රු 70747.00** |
| ඌ. | සලාක දීමනාව (අවස්ථානුකූලව) | - රු 29025.00 |
| එ. | දළ වැටුප ආසන්න වශයෙන් (සලාක දීමනාව ඇතුළත්ව) | **- රු 99,772.00** |

ඒ. නොමිලයේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කාලත්‍රයාට,ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමි වේ.

ඔ. කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඕ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නාවිකයාට, කාලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට).

ක. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු.2,400.00 සිට රු.6,600.00 දක්වා ගෙවල් කුළී දීමනාවන් හිමි වේ.

ග. විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

10. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන්ට උපදෙස්:

අ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. අයදුම්පත් **2025 නොවැම්බර් මස 06 වැනි දින 1200** පැයට ප්‍රථම ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ **"ඉඳුරාම නාවික ශිල්පීන් බඳවා ගැනීම"**යනුවෙන් සටහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195155, 011-7195162, 0760275685 මගින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු පුද්ගලයින්ගේ අයදුම්පත්, අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ලෙස තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඈ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ පළපුරුද්ද පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු/අයදුම්කාරිනිය ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ වත්මන් සේවායෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතු ය;
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ/අයදුම්කාරිනියන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික අස්ථානගතවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. අයදුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අයදුම්කරු/අයදුම්කාරිනිය තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ ආදිය:

අ. ඉහත අවශ්‍යතාවන් සපුරාලන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

| *ඉසව්ව* | *කාලය (විනාඩි/ තත්පර)* | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| මීටර් 1600 දිවීම | | විනාඩි 09 | විනාඩි 11 |
| Push Up | විනාඩි 01 | 12 ක් හෝ ඊට වැඩි | 08 ක් හෝ ඊට වැඩි |
| Sit Up | විනාඩි 01 | 10 ක් හෝ ඊට වැඩි | 07 ක් හෝ ඊට වැඩි |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ඉඳුරාම බඳවා ගැනීමේ නාවිකයකු ලෙස බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ජංගම දුරකථන අංකයට අදාළව වට්ස්ඇප් (whatApp) පණිවුඩ මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර, තැපැල් මගින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් සිදු නොකෙරේ. තව ද සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු/අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

ඊ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් නිර්දේශ කිරීමට අදහස් කරන කවරකු විසින් වුව ද එසේ කල යුත්තේ ඔහුට චරිතය සම්බන්ධ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අයදුම්කරු/අයදුම්කාරිනිය නුසුදුසු අයකු වීමට හේතු වන්නේ ය.

උ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඌ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් ආරක්ෂක නිශ්කාශණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

ඒ. ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

***සටහන -*** මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවන අතර, සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

බීඒකේඑස්පී බානගොඩ, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

<u>ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයට ඉදුරාම නාවිකයන්/කාන්තා නාවිකයන් බඳවා ගැනීම සඳහා වූ ආදර්ශ අයදුම්පත</u>

1. පුරවැසිභාවය :——————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. අයදුම් කරන අංශය :——————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :——————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

5. ස්ථිර ලිපිනය :——————.

6. තැපැල් ලිපිනය :——————.

7. උපන් දිනය :——————.

8. වයස : අවුරුදු :....... මාස :....... දින : ....... (2025 ……….. මස …… වැනි දිනට)

9. උස :............(අඟල්) පපුව :........(අඟල් - පිරිමි) බර :........(කි.ග්‍රෑ)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :——————.

11. දිස්ත්‍රික්කය :——————.

12. ඡන්ද කොට්ඨාසය :——————.

13. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————.

14. දුරකථන අංකය :——————.

15. වට්ස්ඇප් (whatsApp) අංකය :——————.

16. විවාහක හෝ අවිවාහක බව :——————.

17. ස්ත්‍රී /පුරුෂ භාවය : ——————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් (අනුපිළිවෙලින් සඳහන් කරන්න) : ——————.

19. පාසල/ පාසල් හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර : ——————.

| *පාසලේ / විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණිය ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස . (සා.පෙළ)<br>අ.පො.ස . (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ පාඨමාලා/ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *පාඨමාලාවේ/ රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර:

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :——————.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) :——————.

24. පාසලේ දී , විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න). :——————.

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :——————.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම් , ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදු වූයේ කුමක්දැයි සඳහන් කරන්න. :——————.

27. ඔබ මින් පෙර යුධ,ගුවන් සහ නාවික හමුදාවේ සේවය කර තිබේද? සේවය කර ඇත්නම් ඒ පිළිබඳව විස්තර සඳහන් කරන්න : ——————.

28. සිවිල් අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇඟ බැඳ තිබේද? එසේනම් විස්තර සඳහන් කරන්න. : ——————.

29. යුධ අධිකරණයකදී ඔබ වැරදිකරුවකු කර තිබේද? ——————.

30. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව ,ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන බද්ධ ව්‍යාපාර , සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු ——————.

31. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

32. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි.ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඊට අදාළ වන කරුණු ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය......................................      ..............................................,
අයදුම්කරු/අයදුම්කාරිනියගේ අත්සන.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වල අදාළ ලිපි ලේඛනවල පිටපත් ද සමඟ) පහත ලිපිනයට යොමු කරන්න.

**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්) ,**
**නාවික හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 593,**
**කොළඹ 01.**

සම්බන්ධතා විස්තර - දුරකථන අංක : 011-7195155,011-7195162      ජංගම දුරකථනය : 076-0275685

10-263/1

## ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉදුරාම නාවිකයන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

01. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉදුරාම ස්වේච්ඡා නාවික ශිල්පීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතින අතර, පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු ය.

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | වයස | - 2025 නොවැම්බර් මස 06 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 33 ට නොවැඩි විය යුතුයි. |
| ඇ. | උස | - 5' 4" ( සෙ.මී 162.56) |
| ඈ. | ශරීර ස්කන්ධ දර්ශකය | - 17-27 |
| ඉ. | පපුව | - 32" (සෙ.මී 81.28) |
| ඊ. | වර්ණ දෘෂ්ටිය | - එස්ටීඩී II |
| උ. | දුර දර්ශනය | - 6/6 (උපැස්/අක්ෂි කාච රහිතව) (6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන් සලකා බැලිය හැකි ය) . |
| ඌ. | සිවිල් තත්ත්වය | - විවාහක/ අවිවාහක දෙපාර්ශ්වයටම අයදුම් කළ හැකි ය. |

02. **බඳවාගනු ලබන අංශය :**

නැව්බඳ කාර්මික ශිල්පී - (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් තැනීම සම්බන්ධ ඉංජිනේරු)

03. **අධ්‍යාපන සුදුසුකම්**

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ගණිතය, මව්බස හා විද්‍යාව විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතු ය.

ආ. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (එක් වරක දී)

(1) භෞතීය විෂයය ධාරාව හෝ ජීව විද්‍යා විෂයය ධාරාව } භෞතික විද්‍යා විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් අනිවාර්ය වන අතර, ඒ සමග සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව හෝ ඕනෑම තාක්ෂණික විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(2) තාක්ෂණික විෂයය ධාරාව - තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්‍ෂණවේදය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබිය යුතු ය.

04. **වෘත්තීය සුදුසුකම්**

අ. **නැව්බඳ කාර්මික ශිල්පී (II පන්තිය)**

(1) NVQ 5 මට්ටමට සමාන යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම.

විශේෂ සුදුසුකම් -

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව (HND) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් NVQ 5 මට්ටමේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර හතරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **නැව්බඳ කාර්මික ශිල්පී (III පන්තිය)**

(1) NVQ 5 මට්ටමට සමාන යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම.

විශේෂ සුදුසුකම් -

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව (HND) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් NVQ 5 මට්ටමේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඇ. **නැව්බඳ කාර්මික ශිල්පී (IV පන්තිය)**

(1) NVQ 5 මට්ටමට සමාන යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම.

විශේෂ සුදුසුකම් -

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව (HND) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් NVQ 5 මට්ටමේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඈ. **නැව්බඳ කාර්මික ශිල්පී (I ශ්‍රේණිය)**

(1) බඳවා ගැනීමේ අවස්ථාව වන විට NVQ 5 මට්ටමට අදාළ යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක අවසන් වසර හැදෑරීම.

විශේෂ සුදුසුකම් -

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව (HND) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

*හෝ*

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් NVQ 5 මට්ටමේ යාන්ත්‍රික අංශයෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය නොවේ.

5. ඉහත 3 සහ 4 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවන් සපුරාලනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. **සේවා කොන්දේසි :**

අ. අයදුම්කරුවන් ශිල්පීය අංශයේ II, III, IV වන පන්තියේ සහ I වන ශ්‍රේණියේ නාවිකයන් වශයෙන් ස්වේච්ඡා නාවික හමුදාව වෙත මූලික සේවා කාලය වසර 05ක් සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මාස 03ක මූලික පුහුණුවීමේ පාඨමාලාව හැදෑරිය යුතු වේ.

ආ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව බඳවාගත් නාවිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතු ය.

ඇ. සෑම බඳවාගත් නාවිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් සපයනු ලැබේ.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ, බඳවාගත් නාවිකයන් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මඟින් සපයනු ලැබේ.

ඉ. පුහුණුවන කාලසීමාව තුළ දී, යම් නාවිකයෙකු හට සිය කැමැත්තෙන් නාවික හමුදාවෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මඟින් එම නාවිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නාවිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. සියලුම නාවිකයන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

7. **රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:** තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. **වැටුප් හා දීමනා:**

2025.04.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 අනුව වේ. ඒ අනුව,

| | | |
|---|---|---|
| අ. | මූලික වැටුප | - රු. 49,197.00 |
| ආ. | ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| ඇ. | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| ඈ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඉ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඊ. | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00<br>- විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| උ. | දළ වැටුප | **- රු 70,747.00** |
| ඌ. | සලාක දීමනාව (අවස්ථානුකූලව) | - රු 29,025.00 |

දළ වැටුප ආසන්න වශයෙන් (සලාක දීමනාව ඇතුළත්ව) - රු **99,772.00**

එ. නොමිලයේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමි වේ.

ඒ. කඳවුර තුළ වාසය කරන නාවිකයන්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඔ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට).

ඕ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයන්ට රු.2,400.00 සිට රු.6,600.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

ක. විවාහක නාවිකයන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයන්ට අදාළ වන පරිදි අය කරනු ලැබේ.

9. අයදුම්කරුවන්ට උපදෙස් :

අ. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත් **2025 නොවැම්බර් මස 06 වැනි දින 1200** පැයට ප්‍රථම ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"ඉඳුරාම නාවික ශිල්පීන් බඳවා ගැනීම"**යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195162, 011-7195155, 076-0275685 මඟින් ලබා ගත හැකි ය.

ආ. රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්කරු තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙන යම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය.
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය.
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුව සහ පළපුරුද්ද පිළිබඳ සහතික.
(6) මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක්; මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වත්මන් සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතුය.
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික අස්ථානගතවුවහොත් නාවික හමුදාව ඊට වග කියනු නොලැබේ.

10. අයදුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාව අයදුම්කරු තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

11. **තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ ආදිය :**

අ. ඉහත අවශ්‍යතාවන් සපුරාලන අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

| *ඉසව්ව* | *කාලය (මිනිත්තු/ තත්පර)* | *වාර ගණන* |
|---|---|---|
| මීටර් 1600 දිවීම | මිනිත්තු 09 | - |
| Push Up | මිනිත්තු 01 | වාර 12ක් හෝ ඊට වැඩි |
| Sit Up | මිනිත්තු 01 | වාර 10ක් හෝ ඊට වැඩි |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ඉදුරාම බඳවාගනු ලබන නාවිකයෙකු ලෙස බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් ලබා දී ඇති ජංගම දුරකථන අංකයට අදාළව වට්ස්ඇප් (WhatsApp) පණිවුඩ මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර, තැපැල් මඟින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් සිදු නොකෙරේ. තවද, සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

ඊ. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට චරිතය සම්බන්ධ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්*බලපෑම් කිරීමට උත්සාහ කිරීම අයදුම්කරු නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේය.

උ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(ඍ) විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී, අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල සත්‍යතාව සහතික කරනු ලැබේ.

(එ) සියලුම අයදුම්කරුවන්ගේ ආරක්ෂක නිශ්කාශන වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මඟින් නැවත පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

(ඒ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම්කරුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවන් අනුව ඉහත අවශ්‍යතාවන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

**සටහන** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

බීජ්කේඑස්පී බානගොඩ, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01

**ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉදුරාම ස්වේච්ඡා නාවිකයන් බඳවා ගැනීම සඳහා වූ ආදර්ශ අයදුම්පත**

1. පුරවැසිභාවය :——————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. අයදුම්කරන අංශය (ප්‍රමුඛතාව අනුව) :——————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :——————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

5. ස්ථිර ලිපිනය :——————.

6. තැපැල් ලිපිනය :——————.

7. උපන් දිනය :——————.

8. වයස : අවුරුදු ....... මාස ....... දින ....... (2025 ……….. මස …… දිනට)

9. උස : ............(අඟල්) පපුව : ........(අඟල් - පිරිමි) බර : ........(කි.ග්‍රෑ.)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :——————.

11. දිස්ත්‍රික්කය :——————.

12. ඡන්ද කොට්ඨාසය :——————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.

14. දුරකථන අංකය :——————.

15. වට්ස්ඇප් (WhatsApp) අංකය :——————.

16. විවාහක හෝ අවිවාහක බව :——————.

17. ස්ත්‍රී පුරුෂ භාවය :——————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් (අනුපිළිවෙලින් සඳහන් කරන්න) :——————.

19. පාසල/ පාසල් හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ / විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ)<br>අ.පො.ස. (උ/පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ පාඨමාලා/ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *පාඨමාලාවේ/ රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා<br>මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :——————.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) :——————.

24. පාසලේ දී , විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමඟ විස්තර දක්වන්න)

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ කර ඇති සේවය :————.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදු වූයේ කුමක්දැයි සඳහන් කරන්න. :——————.

27. මීට ප්‍රථම යුධ, නාවික සහ ගුවන් හමුදාවල නිත්‍ය හෝ ස්වේච්ඡා බලකායන් හි සේවය කර ඇත්නම් එසේ සේවය කරනු ලැබූ කාල පරිච්ඡේදය හා දැරූ තනතුරු පිළිබඳ සඳහන් කරන්න. :————.

28. සිවිල් අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇප බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :———.

29. යුධ අධිකරණයක දී ඔබ වැරදිකරුවකු කර තිබේද? :———.

30. රජයේ දෙපාර්තමේන්තුවක දී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන බද්ධ ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න.

31. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

32. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඊට අදාළ වන කරුණු ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය : ......................................

.........................................
අයදුම්කරුගේ අත්සන

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වල අදාළ ලිපි ලේඛනවල පිටපත් ද සමඟ) ලිපිනයට යොමු කරන්න.

**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්) ,**
**නාවික හමුදා මූලස්ථානය,**
**තැ. පෙ. 593,**
**කොළඹ 01.**

සම්බන්ධතා විස්තර : දුරකථන අංක : **011-7195155,011-7195162** ජංගම දුරකථන අංකය : **076-0275685**

10-263/2

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

**01. ලේකම් තනතුර - තනතුරු 01**

සුදුසුකම් :

බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :

1. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳව සාමාන්‍ය උපාධියක් ලබා තිබිය යුතුය;

2. විශ්වවිද්‍යාලයීය උපාධිය ලබා ගැනීමෙන් පසුව තනතුර හා සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම;

හෝ

3. පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයකින් නීතිය පිළිබඳව වෘත්තීය සුදුසුකමක් ලබා ගැනීමෙන් පසු තනතුර හා සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම.

වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 96,650 - 10 x 2,480 - 15 x3,450 - රු. 173,200/- (**MM** 1 - 3 - 2025)

ක්වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**02. අභ්‍යන්තර විගණක තනතුර - තනතුරු 01**

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2) :

1. ගණකාධිකරණය, මූල්‍ය, වාණිජ්‍ය හෝ මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම;

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ''කනිෂ්ඨ කළමනාකාර'' JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 91,690 - 10 x 2,480 - 15 x 3,450 - රු. 168,240/- (MM 1 - 1- 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**03. ඇගයීම් හා අධීක්ෂණ නිලධාරි තනතුර - තනතුර 01**

සුදුසුකම් :

බාහිර සුදුසුකම් :

1. සංඛ්‍යානය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකාරණය හෝ මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම;

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

2. ''කනිෂ්ඨ කළමනාකාර'' JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 91,690 - 10 x 2,480 - 15 x 3,450 - රු. 168,240/- (MM 1 - 1- 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**04. පර්යේෂණ නිලධාරි තනතුර - තනතුරු 01**

සුදුසුකම් :

*බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්-*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳව සාමාන්‍ය උපාධියක් තිබිය යුතු අතර, අධ්‍යයන පර්යේෂණ හෝ නීති ක්ෂේත්‍රය පිළිබඳව යටත් පිරිසෙයින් වසරක පළපුරුද්දක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු විය යුතුය.

*වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 91,650 - 10 x 2,480 - 15x 3,450 - රු. 168,200/- (AR 1- 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**05. පරිපාලන නිලධාරි තනතුර - තනතුරු 01**

සුදුසුකම් :

*බාහිර අයදුම්කරුවන්-*

මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, වාණිජ්‍ය හෝ මෙම තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

2. ''කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන'' (MA 1)සේවා ශ්‍රේණියෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 72,650 - 10 x 1,360 - 18 x 2,040 - රු. 122,970/- (JM 1 - 1- 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**06. භාෂා පරිවර්තක - තනතුරු 01**

සුදුසුකම් :

*බාහිර අයදුම්කරුවන්* :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භාෂා පරිවර්තනය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*අභ්‍යන්තර අයදුම්කරුවන්* :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් සපුරා තිබීම.

*වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 64,320 - 10 x 1,360 - 15 x 1,670 - 5 x 2,040 - රු. 113,170/- (MA 4 - 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**07. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 03**

සුදුසුකම් :

*බාහිර අයදුම්කරුවන්*

i. සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය ඇතුළු අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක වරක දී විෂයන් හයක් (06)සමත්ව තිබීම;

සහ

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂයන් තුනක් (03) සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

*අභ්‍යන්තර අයදුම්කරුවන්-*

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයට අයත් සේවකයන්;

i. සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය ඇතුළු අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක වරක දී විෂයන් හයක් (06) සමත්ව තිබීම. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක යතුරු ලියනය හෝ වෙනත් එවැනි ක්ෂේත්‍රයක් පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස පිළිගැනේ;

ii. වර්තමාන තනතුරේ සේවය ස්ථිර කර තිබීම;

iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වසර පහක අඛණ්ඩ කාලයක් සඳහා ස්ථිර තනතුරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** :

2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 46,220 - 10 x 540 - 7 x 630 - 12 x 1080 - 12 x 1,280 - රු. 84,350/- (MA 1 - 2 - 2025)

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප ගෙවනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම-**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
ii. තනතුරට අදාළ රාජකාරි මනාව ඉටු කිරීමට සේවය කිරීමට කායික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.
iii. මනා චරිතයකින් යුක්ත පුද්ගලයෙකු විය යුතුය.

**වයස් සීමාව :**

තනතුරු සඳහා අයදුම් කරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**අනෙකුත් දීමනා :**

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ.

**සේවා කොන්දේසි :**

- මෙම තනතුරු ස්ථිරය. වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.
- සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල : සේවකයා තම වැටුපෙන් 8% ක ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ක ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයකින් සේවායෝජකයා ගෙවනු ලබයි.

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ <http://www.judgesinstitute.lk/> පළකර ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණකර **2025.10.31** වැනි දිනට හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද තැපැලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ,<br>
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,<br>
අංක 80 (5 වන හා 6 වන මහල*),<br>
අධිකරණ මාවත,<br>
කොළඹ 12.

ආදර්ශ අයදුම්පත්‍රය

අයදුම් කරන තනතුර : ..............................................................................................

පුද්ගලික තොරතුරු

- සම්පූර්ණ නම : ..............................................................................................
- පුද්ගලික ලිපිනය : ..............................................................................................
- ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................................
- උපන් දිනය : ..................................... වයස ....................................
- දුරකථන අංකය : .......................................................................
- විද්‍යුත් තැපැල් ලිපිනය : ..............................................................................................
- ස්ත්‍රී/ පුරුෂ භාවය : ..............................................................................................

අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා/පෙළ) විභාගය

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ/පෙළ) විභාගය

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උපාධි/ඩිප්ලෝමා හෝ උසස් අධ්‍යාපන සුදුසුකම්) :

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

3. ..............................................................................................................................................

4. ..............................................................................................................................................

5. ..............................................................................................................................................

වෘත්තීය සුදුසුකම් :

1. ........................................................................................................................................................
2. ........................................................................................................................................................
3. ........................................................................................................................................................
4. ........................................................................................................................................................
5. ........................................................................................................................................................

සේවා පළපුරුද්ද :

1. ........................................................................................................................................................
2. ........................................................................................................................................................
3. ........................................................................................................................................................
4. ........................................................................................................................................................
5. ........................................................................................................................................................

කරුණාකර ඔබ අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් සපුරා තිබේදැයි සඳහන් කරන්න.

(ඔව්/නැත) ........................................................................................................................................

ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු

| | |
|---|---|
| 1. නම | 2. නම |
| තනතුර | තනතුර |
| දුරකථන අංකය | දුරකථන අංකය |

අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශකර සිටිමි.

අයදුම්කරුගේ අත්සන ........................................................................................

දිනය ........................................................................................

10 - 247

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

### පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. කණිෂ්ඨ කළමනාකරණ තනතුරු | |
| 01.1. ප්‍රතිකාර හා විමර්ශන නිලධාරි (JM 1-1) | 03 |
| 01.2. මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි (JM 1-1) | 05 |
| 02. බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි තනතුරු | |
| 2.1. සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි (MA 5-2) | 05 |
| 03. "කළමනාකරණ සහකාර" - තාක්ෂණ තනතුරු | |
| 03.1. උපදේශන සහකාර (MA 2-1) | 30 |
| 03.2. මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර (MA 2-1) | 03 |

1.1. තනතුරු නාමය - **ප්‍රතිකාර හා විමර්ශන නිලධාරි**
සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර - (JM 1-1)
පුරප්පාඩු ගණන - 03

01.1.1 සුදුසුකම්

01.1.1.1 බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

01.1.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

03. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

04. බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

01.1.2.1. වයස
අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

01.1.2.2. වැටුප් කේත අංකය - JM 1-1
01.1.2.3. මාසික වැටුප් පරිමාණය - 2025.01.01 දින සිට

JM 1-1 ක.ව. 01/2025 රු.(72,650 - 10 x 1,360 - 18 x 2,040 - රු. 122,970/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

01.2 තනතුරු නාමය - **මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි**

සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර - (JM 1-1)
පුරප්පාඩු ගණන - 05

01.2.1. සුදුසුකම්
01.2.1.1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

01.2.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

03. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

04. බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

01.2.2 වයස

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

01.2.3. වැටුප් කේත අංකය - JM 1-1

01.2.4. මාසික වැටුප් පරිමාණය - 2025.01.01 දින සිට ක.ච. 01/2025 JM 1-1 රු.(72,650 - 10 x 1,360 - 18 x 2,040 -රු. 122,970/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

02.1. තනතුරු නාමය - **සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි**
සේවා ගණය - බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි (MA 5-2)
පුරප්පාඩු ගණන - 05

02.1.1. සුදුසුකම්

02.1.1.1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.;

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

02.1.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 01 හෝ 02)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

02. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි තනතුරක II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

02.1.2. වයස

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

02.1.3. වැටුප් කේත අංකය - MA 5-2

02.1.4. මාසික වැටුප් පරිමාණය - 2025.01.01 දින සිට ක.ච. 01/2025 MA 5-2 රු.(62,310 - 10 x 1,360 - 15 x 1,670 - 5 x 2,040 - රු. 111,160/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

03.1. තනතුරු නාමය - **උපදේශන සහකාර**
සේවා ගණය - "කළමනාකරණ සහකාර" - තාක්ෂණ (MA 2-1)
පුරප්පාඩු ගණන - 30

03.1.1. සුදුසුකම්

03.1.1.1. බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාළ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

සමඟ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් උපදේශනය/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ මනෝ විද්‍යාව/ සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03.1.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

03.1.2. වයස

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03.1.3. වැටුප් කාණ්ඩය - MA 2-1

03.1.3.1. වැටුප් පරිමාණය - 2025.01.01 දින සිට

ක.ව. 01/2025 MA 2-1 රු.(50,540 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1,190 - රු. 87,710/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

03.2. තනතුරු නාමය - **මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර**
සේවා ගණය - "කළමනාකරණ සහකාර" - තාක්ෂණ
පුරප්පාඩු ගණන - 03

03.2.1. සුදුසුකම්

03.2.1.1. බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාළ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

සමඟ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ මනෝ විද්‍යාව/ සමාජ වැඩ/ සන්නිවේදනය යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03.2.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

03.2.2. වයස

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03.2.3. වැටුප් කාණ්ඩය - MA 2-1

03.2.3.1. වැටුප් පරිමාණය - 2025.01.01 දින සිට
ක.ව. 01/2025 MA 2-1 රු.(50,540 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1,190 - රු. 87,710/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

<u>සියළු තනතුරු සඳහා පොදු කරුණු :</u>

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කළ යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරග විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

පත්වීමේ ස්වභාවය

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

අයදුම්පත් ගාස්තුව

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ අංක 1643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ: (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2025.11.07** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ ආදර්ශ අයදුම්පත අනුව අයදුම් නොකළ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

සභාපති

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
383, කෝට්ටේ පාර,
රාජගිරිය.

ප්‍රකාශිත දිනය : 2025.10.17

10-285

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (I) (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ නිලධාරින් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරින් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතුය.)**

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 ශ්‍රේණියේ නිලධාරින් හා අංක අමප/21/1824/308/139 සහ 2021.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අංක අමප/12/1101/530/035 සහ 2012.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අධි සේවක පදනම මත පත් කරනු ලැබූ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026** පෙබරවාරි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය (වගුව 01) හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. සෑම ප්‍රශ්න පත්‍රයක්ම කෙටි

පිළිතුරු අපේක්ෂිත අර්ධ ව්‍යුහගත හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.

(වගුව 01)

| විෂය අංකය | විෂයය | කාලය | ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|---|
| 01 | **පාසල් පරිපාලනය හා අධීක්ෂණය** | පැය 3 | 100 | 40 |
| 02 | **පාසල් සැලසුම්කරණය** | පැය 3 | 100 | 40 |
| 03 | **අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර** | පැය 3 | 100 | 40 |

විෂය නිර්දේශය :-

(i) **පාසල් පරිපාලනය හා අධීක්ෂණය**

පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) **පාසල් සැලසුම්කරණය**

සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) **අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර**

ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ.

03. **විභාගයේ භාෂා මාධ්‍යය :-** සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාගාපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

05. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක **01 සිට 07** තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන්කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල හා දෙමළ ඉල්ලුම් පත්‍රවල ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:- ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

06. ඉල්ලුම් පත්‍ර **2025.11.24** වැනි දින හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ /කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්

කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

08. i ප්‍රවේශ පත්‍ර පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

ii ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතිකකර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

iii ඉහත 07 ඡේදයේ සඳහන්කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

9. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(i) ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. **විභාග ගාස්තු :**

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතීනම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

13. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 09 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන,
උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (I) (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන ශ්‍රේණියේ නිලධාරින් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරින් විභාගය සඳහා පෙනී සිටිය යුතුය.)**

**The Second Efficiency Bar Examination for Officers of Sri Lanka Principals' Service – 2025 (I) (The Officers who are in Sri Lanka Principals' Service Grade 2 and appointed to Sri Lanka Principals' Service Class 2 Grade II on Supernumerary Basis should sit for the Examination.)**

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ, වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. (විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

   සිංහල - 2

   දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

   (උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

   ..........................................................................

   (ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

   ..........................................................................

   (උදා:- GUNAWARDHANA, H.M.S.K.)

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)

   ..........................................................................

3. ලිපිනය :

   i. පෞද්ගලික : .................................................

   ii. රාජකාරි : ......................................................

   iii. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ......................

   (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

   iv. දුරකථන අංකය : (රාජකාරි)..............................

4. i. විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය: .....................

   ii. අධිසේවක පත්වීමක් ද : ඔව් ☐ නැත ☐

   iii. පාසල / කාර්යාලය : .........................................

   iv. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය ..............................

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

   ☐☐☐☐☐☐☐☐☐☐☐☐

   (ii) උපන් දිනය :

   වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

   (iii) ස්ත්‍රී/පුරුෂ භාවය:

   පුරුෂ - 0

   ස්ත්‍රී -1 ☐

   (අදාළ අංකය කොටුව තුළ යොදන්න)

6. ජංගම දුරකථන අංකය :

   ☐☐☐☐☐☐☐☐☐☐

7. ගැසට් නිවේදනයෙහි 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන්

| *විෂයය* | *විෂය අංකය* | *අයදුම් කරන විෂය අංකය* |
|---|---|---|
| පාසල් පරිපාලනය හා අධීක්ෂණය | 01 | |
| පාසල් සැලසුම්කරණය | 02 | |
| අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර | 03 | |

අදාළ විෂය අංකය/අංක කොටුව/ කොටු තුළ ලියන්න.

8. මීට ප්‍රථම අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය

විෂය සමත් නිලධාරින් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 33/2014 පරිදි මෙම 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම විෂය සමත් නම් වසර, සාමාර්ථය හා මාධ්‍යය ද සඳහන් කරන්න.

| විෂය | වසර | සාමාර්ථය | මාධ්‍යය |
|---|---|---|---|
| අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය | | | |

9. විභාග ගාස්තු :

(i) ගෙවන ලද තැපැල්/උපතැපල් කාර්යාලය : ............

(ii) ගෙවූ මුදල : ................. (iii) ගෙවූ දිනය : ........

(iv) ලදුපත් අංකය: ................................

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

10. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

........................., ....................................,
දිනය ඉල්ලුම්කරුගේ අත්සන.

11. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/පළාතේ නිලධාරියකු බවත් අද දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් කළ බවත් සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

..........................................,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ / අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය : .........................
දිනය : ...........................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදාළ නොවන වචන කපා හරින්න.)

10-251/2

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (I) (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන ශ්‍රේණියේ නිලධාරින් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පත් කරනු ලැබූ නිලධාරින් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතුය.)**

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන ශ්‍රේණියේ නිලධාරින් හා අංක අමප/21/1824/308/139 සහ 2021.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අංක අමප/12/1101/530/035 සහ 2012.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට අධි සේවක පදනම මත පත් කරනු ලැබූ නිලධාරින් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 පෙබරවාරි මස** කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පටිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

(අ) (වගුව 01) - විභාග පටිපාටිය

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | **ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති** | පැය 2 | 100 | 40 |
| 02 | **පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි** | පැය 2 | 100 | 40 |

(ආ) (වගුව 02) - විෂය නිර්දේශය

| විෂය අංක | විෂය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | **ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති** | ආයතන සංග්‍රහයේ VII,VIII,IX,X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII ,XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII, යන පරිච්ඡේද හා අංක 2310/29 හා 2022.12.14 දිනැතිව *ගැසට්* පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| 02 | **පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි** | අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ චෙතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ. |

03. විභාගයේ භාෂා මාධ්‍යය :- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාගාපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

05. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක **01 සිට 07** තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල හා දෙමළ ඉල්ලුම් පත්‍රවල ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

06. ඉල්ලුම්පත්‍ර **2025.11.24** වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

08 i. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

ii. ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින්

බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

ii. ඉහත 07 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්‍ෂකයන්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

09. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ. :

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය.

එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.

තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ. :

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතීනම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

13. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 09 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2025 (I) (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 ශ්‍රේණියේ නිලධාරීන් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පත් කරනු ලැබූ නිලධාරීන් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතුය.)**

**The First Efficiency Bar Examination for Officers of Sri Lanka Principals' Service - 2025(I) (The Officers who are in Sri Lanka Principals' Service Grade 3 and appointed to Sri Lanka Principals' Service Class 3 on Supernumerary Basis should sit for the Examination.)**

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ / අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ /පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ. වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2

දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

..........................................................................

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
..........................................................................

(උදා:- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................

3. ලිපිනය :

i. පෞද්ගලික : ..................................................

ii. රාජකාරි : ......................................................

iii. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ......................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

iv. දුරකථන අංකය : (රාජකාරි).............................

4. i. විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය: .....................

ii. අධිසේවක පත්වීමක් ද : ඔව් ☐ නැත ☐
iii. පාසල / කාර්යාලය : ..........................................
iv. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය ...............................

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(ii) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය:

පුරුෂ - 0

ස්ත්‍රී - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

6. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

7. ගැසට් නිවේදනයෙහි 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන්

| විෂයය | විෂය අංකය | අයදුම් කරන විෂය අංකය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | 01 | |
| පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි | 02 | |

අදාළ විෂය අංකය/අංක කොටුව/ කොටු තුළ ලියන්න.

8. විභාග ගාස්තු :

(i) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :- ...........
(ii) ගෙවූ මුදල :- ................. (iii) ගෙවූ දිනය :-........
(iv) ලදුපත් අංකය:- ................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය

9. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

........................ ..............................
දිනය ඉල්ලුම්කරුගේ අත්සන

10. විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/පළාතේ නිලධාරියකු බවත් අද දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් කළ බවත් සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

..........................................
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ

අත්සන

ලිපිනය : .........................
දිනය : ............................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න)

10-251/1

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

1. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 21 දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර, **2025 නොවැම්බර් මස 21 දින ප.ව. 9.00**ට අවසන් වේ. මෙම විභාගය **2026 පෙබරවාරි** මස පැවැත්වේ.

2. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ තනතුරු සඳහා තෝරා පත්කර ගනු ඇත.

3. මෙහිදී පිරවීමට අපේක්ෂිත **මුළු පුරප්පාඩු සංඛ්‍යාව 555**කි. පත්වීම ක්‍රියාත්මකවන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

4. පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50%ක් වත් විය යුතු ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 අනුව ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

5. වැටුප් පරිමාණය: - 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 50,090 - 10x540 - 11x630 - 10x1,010 - 10x1,190 - රු. 84,420/= (MT 1-2025) ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6. මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත්වේ.

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

8. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

9. සුදුසුකම් : - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ. :-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. **(ඒ අනුව 2007.11.21 දිනට හෝ ඊට පෙර හා 1990.11.21 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.);**

(ඇ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය;

(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය;

(ඉ) අධ්‍යාපන සුදුසුකම් -

(01) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් පහකට (05) සම්මාන සහිතව විෂයයන් හයකින් (06) **<u>දෙවරකට නොවැඩි</u> වාර ගණනක දී සමත් වීම;**

(ඊ) වෘත්තීය සුදුසුකම් -

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක්/උසස් ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500 කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම;

හෝ

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්-

(1) පරිගණක/තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) හෝ ඊට ඉහළ සහතිකය ලබා තිබීම;

හෝ

(2) පැය 1500 ට නොඅඩු පරිගණක/ තොරතුරු තාක්ෂණ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින **2025 නොවැම්බර් මස 21** දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. විභාග පරිපාටිය:

10.1 විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත් වේ. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.2 විභාග විෂයයන් සහ ඒ ඒ විෂයට වෙන් කෙරෙන ලකුණු පහත දැක්වේ.

| | ලකුණු | කාලය |
|---|---|---|
| (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 100 යි | පැය 2 යි |
| (ii) අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |
| මුළු ලකුණු | 200 | |

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය :

විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධතීන්/මෘදුකාංග/දෘඩාංග පිළිබඳ දැනුම, වෙබ් හා අනෙකුත් තොරතුරු පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂාව, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Database) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, පරිගණක ජාල කළමනාකරණය පිළිබඳ දැනුම, අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

අභියෝග්‍යතාව

මෙම ප්‍රශ්න පත්‍රය විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

***සටහන :***

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයන්ගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් (40%) සියයට හතළිහක්වත් අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් (50%) සියයට පනහක්වත් ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

11. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් .- අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක්

ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12. විභාග කොන්දේසි:

I. දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

II. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට එවිය යුතුය.

III. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතුය.

IV. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය.

V. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. මාර්ගගත ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති හර කාඩ්පතක් මගින් (Debit Card with online payments facility)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය මගින් (Online Banking Method, Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payment)

*සටහන:* ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

VI. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

VII. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

VIII. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ /රජයේ සංස්ථාවක අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

*සටහන :* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

IX. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එම විස්තර සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

X. මෙහි උපලේඛනය I අනුව විභාගයට පෙනීසිටින නගරය හා නගර අංකය කැමැත්තේ අනුපිළිවෙළ අනුව පළමු හා දෙවන තේරීම වශයෙන් දැක්විය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයන් ගණනක් නොසිටියහොත් යාබඳ නගරයක් වෙත යොමු කරනු ලැබේ. කෙසේ වුව ද එකී මධ්‍යස්ථාන සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

XI. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

XII. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XIII. ***ප්‍රතිඵල නිකුත් කිරීම*** - ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වනසේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14.0 මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් සිංහල නිවේදනය බලපැවැත්වේ.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

<u>උපලේඛන අංක I</u>

***විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර***

| *අනු. අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 1 | කොළඹ | 01 |
| 2 | මහනුවර | 04 |
| 3 | ගාල්ල | 07 |
| 4 | යාපනය | 10 |
| 5 | මඩකලපුව | 15 |
| 6 | කුරුණෑගල | 18 |
| 7 | අනුරාධපුර | 20 |
| 8 | බදුල්ල | 22 |
| 9 | රත්නපුරය | 24 |

10-275/1

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exam/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 21 දින පෙ.ව. 9.00ට විවෘතවන අතර 2025 නොවැම්බර් මස 21 දින ප.ව. 9.00ට අවසන් වේ.** මෙම විභාගය **2026 පෙබරවාරි මස කොළඹ දී** පැවැත්වේ.

දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

2.0 විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 මෙහි දී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව **132කි.** පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය. තෝරාගනු ලබන අපේක්ෂකයින්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50%ක් වත් විය යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 අනුව ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

5.0 *වැටුප් පරිමාණය* :- 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 62,230 - 10 x 1,190 - 11 x 1,360 - 15 x 1,670 – රු. 114, 140/- (MN-06-2025) ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරින් යටත්වේ.

7.0 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

8.0 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

9.0 *සුදුසුකම්*:- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(*ආ*) අයදුම්පත් බාරගන්නා අවසාන දිනය වන **2025.11.21** දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2004.11.21 දිනට හෝ ඊට පෙර හා 1990.11.21 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(*ඈ*) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(*ඉ*) **අධ්‍යාපන සුදුසුකම් :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(2) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහි දී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.);

*සහ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

(3) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

*සහ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සටහන

1. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් බාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

2. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

10.0 විභාග පරිපාටිය හා විෂයය නිර්දේශය :-

10.1 විභාගය **ප්‍රශ්න පත්‍ර තුනකින්** සමන්විත වේ. මෙම විභාගය **සිංහල, දෙමළ හා ඉංග්‍රීසි** මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.2 විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ. :

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| (01) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පැය 2 | 100 | 40 |
| (02) | අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |
| (03) | සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |

10.3 (01)**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය :**

විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති/මෘදුකාංග/දෘඪාංග පිළිබඳ දැනුම, e රාජ්‍ය (e-gov) සංකල්පය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, තොරතුරු, පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Database) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, දෘඪාංග දත්ත සන්නිවේදනය හා පරිගණකජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණය සහ නව අන්තර්ජාල සේවාවන්, විද්‍යුත් තැපැල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අධීක්ෂණ හැකියාව ගැඹුරු ලෙස පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(02) **අභියෝග්‍යතාව :**

විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූලව කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් **(50)** සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(03) **සාමාන්‍ය බුද්ධිය :**

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

සටහන

3. සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් ලබාදෙනු ලැබේ.

10.4 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ විභාගය සමත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්

විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

සම්මුඛ පරීක්ෂණය -

ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනීසිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අපේක්ෂකයන් සම්බන්ධයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් තීරණය කරනු ඇත.

11.0 ව්‍යාජ තොරතුරු සඳහා දැඩුවම් -

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑ ම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

12.0 විභාග කොන්දේසි :

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනට ම පෙනී සිටිය යුතුය.

II. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. විභාග ගාස්තුව රු.600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) මාර්ගගත ගෙවීම් පහසුකම සක්‍රිය කර ඇති හර කාඩ්පතක් මගින් ( Debit Card with online payment facility)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method, Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Slip Payment, Bank of Ceylon)

*සටහන* :

4. ඉහත ක්‍රමය මැගින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

VI. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ

විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

සටහන :

5. ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන :

6. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VIII. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

IX. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

X. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XI. **ප්‍රතිඵල නිකුත් කිරීම** - ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කිසි කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

10-275/2

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exam/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 නොවැම්බර් මස 21 වැනි දින ප.ව. 9.00**ට අවසන් වේ. මෙම විභාගය **2026 පෙබරවාරි** මස කොළඹ දී පැවැත්වේ.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව **57කි.** පත්වීම ක්‍රියාත්මක දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප් පරිමාණය :- 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය -

රු. 62,230 - 10 x 1,190 - 11 x 1,360 - 15 x 1,670 – රු. 114,140/- (MN 6-2025) ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6.0 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

7.0 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

8.0 සුදුසුකම් :- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

(ඇ) **පළපුරුද්ද :**

(1) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ නිලධරයකු වීම හා රාජ්‍ය

සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම;

හෝ

(2) (i) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පත්වීම ස්ථිර කළ නිලධරයකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම;

සහ

(ii) මෙම නිවේදනයේ 8.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඉ) ඉහත සුදුසුකම්වලට අමතරව අයදුම්පත් කැඳවන අවසාන දිනට නිලධාරියා සේවයේ ස්ථිර කර තිබිය යුතුය.

8.1 අධ්‍යාපන සුදුසුකම්:

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස පවතින උපාධියක් ලබා තිබීම. (මෙහි දී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ විය යුතුය.);

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

(3) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම;

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සටහන :

1. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දින **2025 නොවැම්බර් මස 21** දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

9.0 විභාග පරිපාටිය සහ විෂය නිර්දේශය:-

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 . අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය | පැය 2 | 100 | 40 |

1. අභියෝග්‍යතාව :
විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යාලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතවන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය :
රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය

පරිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න සහ රචනා ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන :**

2. සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයාගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි, ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් ලබා දෙනු ලැබේ.

**10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් -**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**11.0 විභාග කොන්දේසි:**

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලබා දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතුය.

II. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. මාර්ගගත ගෙවීම් පහසුකම සක්‍රිය කර ඇති හර කාඩ්පතක් මගින් ( Debit Card with online payment facility)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method, Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Teller Slip Payment, Bank of Ceylon)

**සටහන :**

3. ඉහත ක්‍රමය මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ **උපදෙස්** වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රමය මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

VI. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

**සටහන**

4. ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා

අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත සහ විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

VIII. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. ප්‍රවේශ පත්‍රය පරීක්ෂාකර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IX. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

X. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

XI. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.
(i) ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

XII. **ප්‍රතිඵල නිකුත් කිරීම** - ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඇතුළත්වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

12.0 විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

13.0 මෙහි සඳහන් නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

14.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

10-275/3

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.)

සාමය, ගැටුම් කළමණාකරනය සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
(ප්‍රධාන බඳවාගැනීම - 2025/2026)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ සාමය, ගැටුම් කළමණාකරනය සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, දේශපාලන විද්‍යාව සහ නීතිය යන අංශයන්හි අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, අධ්‍යාපන අංශයේ රැකියා නියුක්තිකයන්, සමාජ ක්‍රියාකාරීන් සහ විදේශගතව සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිස්, ගැටුම් කළමනාකරණය සහ සාමය ගොඩනැන්වීම පිළිබඳව හා සමාජ වැඩ පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

**සුදුසුකම්** : අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත්වීම;

හෝ

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**සම්පූර්ණ අර්ස** (Total credits) : 30 කි.

**සාමාසික ගණන** : සාමාසික 02 කි.
**ඩිප්ලෝමාවේ ස්වභාවය** : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**ඉගැන්වීම් ක්‍රමවේදය** : සජීවීව සහ LMS පද්ධතිය හරහා ඉගැන්වීම්, පහසු දිනයක් තුළදී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.

**මාධ්‍ය** : සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : මාස 12කි.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු** : සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000.00 කි.

ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු. 36,000 ක මුදල එකවර හෝ වාරික 12කින් ගෙවා අවසන් කළ හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය** : අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළහැකි ලේඛනයක ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ගුවන් ගමන් බලපත්‍රය)
2. අ. පො. ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප;
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්;

0719136683 (WhatsApp ) අංකයට යොමු කළ යුතුය.

**පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය** : 2025.11.11 වේ.

**වැඩි විස්තර සඳහා** : කාර්යාල වේලාවන්වන **පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 0813169800 දුරකථන අංකය** හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

10-227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.